# දකුණු පළාත් සභාව

தென் மாகாண சபை

# SOUTHERN PROVINCIAL COUNCIL

## අධ්‍යාපන , ඉඩම් හා ඉඩම් සංවර්ධන , මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය

கல்வி, காணி மற்றும் காணி அபிவிருத்தி, நெடுஞ்சாலைகள் மற்றும் தகவல் அமைச்சு

**Ministry of Education, Land & Land Development, Highways & Information**

**බිම් මහල, "දක්ෂිණ පාය" , ලබුදුව, ගාල්ල.** கீழ் மாடி,"தக்ஷின பாய",லபுதுவ,காலி. Ground Floor, "Dakshina Paya" , Labuduwa, Galle.

| මගේ අංකය. / எனது இல. / My No. | SP/Edumin/Ad/13/An/2026 | ඔබේ අංකය. / உனது இல. / Your No. | | දිනය. / திகதி. / Date. | 2026.07. 20 |
|---|---|---|---|---|---|

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය,
ගාල්ල,අම්බලන්ගොඩ,ඇල්පිටිය,උඩුගම,මාතර,අකුරැස්ස,මුලටියන,දෙනියාය,හම්බන්තොට,වලස්මුල්ල,
තංගල්ල

<u>වාර්ෂික ස්ථාන මාරු - 2026</u>

<u>අනධ්‍යයන සේවක සේවය - දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව</u>

උක්ත කරුණ සම්බන්ධ මගේ අංක 01/2026 දරණ අනධ්‍යයන සේවක සේවයේ වාර්ෂික ස්ථාන මාරු අභ්‍යන්තර චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව උක්ත සේවාවන්හි සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන් සම්බන්ධයෙන් 2026 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ ප්‍රකාරව සකස් කරන ලද මාරු මණ්ඩල තීරණ අමාත්‍යාංශයීය වෙබ් අඩවියට (edumin.sp.gov.lk) යොමු කර ඇති අතර එම ස්ථාන මාරුවීම් 2026.09.01 දින සිට ක්‍රියාත්මක කරන ලෙස මෙයින් දන්වමි.

03. ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දින වන විට ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියන්ගේ ස්ථාන මාරුවීම් ප්‍රසූත නිවාඩු අවසන්ව සේවයට වාර්තා කළ දිනට සතියකට පසු ක්‍රියාත්මක කළ යුතුය.

04. තවද, මෙම ස්ථාන මාරුවීම් නියෝග පිළිබඳව අදාළ සේවක මහත්ම මහත්මීන්ට කල් ඇතිව දැනුම් දී නියමිත දිනයේදී නව සේවා ස්ථානයෙහි රාජකාරී භාර ගැනීමට හැකිවන පරිදි ඔවුන් සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කළ යුතු අතර, නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන සේවක මහත්ම මහත්මීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවටද අදාළ සේවක මහත්ම මහත්මීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

05. මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් කිසියම් සේවක මහත්මයකු හෝ මහත්මියක හෝ අභියාචනා ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම්, අංක 01/2026 දරණ චක්‍රලේඛයෙහි ආකෘති අංක 03 ප්‍රකාරව අභියාචනා අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර 2026.08.03 දිනට ප්‍රථම කලාප අධ්‍යාපන කාර්යාලය වෙත හා කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් 2026.08.08 දිනට ප්‍රථම මෙම අමාත්‍යාංශය වෙත සෘජුවම ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලයෙන් සලකා බැලීමට කටයුතු නොකරන බව ද අවධාරණය කරමි.

එන්.කේ.ආර්. පතිරණ
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
දකුණු පළාත

**ලේකම්** / செயலாளர் / Secretary: 091-2246156, 091-2030701
**කාර්යාලය** / காரியாலயம் / Office: 091-2030700 **පාලන** / நிர்வாகம் / Administration; 091-2030705 **අධ්‍යාපන** / கல்வி / Education
091-2030703 **සැලසුම්** / திட்டமிடல் / Planning; 091-2030702 **ගිණුම්** / கணக்காய்வு / Accounts
**ෆැක්ස්** / பெக்ஸ் / Fax: 091-2246157, 091-2234044
**ඊමේල්** / மின்னஞ்சல் / E-mail : secretary@edu.min.spgov.lk **ක්ෂණික ඇමතුම්** / அதிரடி அழைப்பு / Hot Line : 091-2030700 **වෙබ් අඩවිය** / இணையத்தளம் / web site : www.edumin.sp.gov.lk

06. ස්ථාන මාරුවීම් ලබා ඇති කිසිදු සේවක මහත්මයකු හෝ මහත්මියක හෝ නියමිත දිනයෙන් පසුව නිදහස් නොකොට රඳවා ගැනීම නොකළ යුතු අතර, එම සේවක මහත්ම මහත්මීන් අභියාචනා ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා කාලය ප්‍රමාණවත් වන පරිදි මෙම තීරණ පිළිබඳව එම සේවක මහත්ම මහත්මීන් කඩිනමින් දැනුවත් කිරීම හා නියමිත දිනයේදී නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකිවන පරිදි අදාළ සේවක මහත්ම මහත්මීන් නිදහස් කිරීම ඔබගේ හා පාසලේ විදුහල්පතිගේ වගකීම වන බවද අවධාරණය කරමි.

07. මෙම ස්ථාන මාරු තීරණ පෙර සඳහන් කළ පරිදි අමාත්‍යාංශ වෙබ් අඩවිය වෙත (edumin.sp.gov.lk) මුදාහැර ඇති බැවින් එම තීරණ වල දෘඩ පිටපත් තැපැල් මඟින් යොමු කිරීමක් සිදු නොකරන හෙයින් මේ පිළිබඳව ඔබ කලාපයට අයත් සියළු ආයතන ප්‍රධානීන් වෙත දැන්වීම සිදු කළ යුතු අතර, එම ස්ථාන මාරු තීරණ දුටු බවට තම සේවා ස්ථානයට අයත් එක් එක් සේවක මහත්ම මහත්මීන්ගෙන් අත්සන් ලබා ගෙන ගොනුකර තබා ගත යුතු බවට සියළු ආයතන ප්‍රධානීන්, පාසල් විදුහල්පතිවරුන් දැනුවත් කරන ලෙසට ද තවදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

එන්.කේ.ආර්. පතිරණ
ලේකම් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය දකුණු පළාත.

එන්.කේ.ආර්.පතිරණ
ලේකම්

ආකෘති අංක 03

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු අනධ්‍යයන සේවක සේවයේ වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කිරීම

අයදුම්පත්‍රය

(ඔබගේ තනතුර ඉදිරියෙන් ✓ ලකුණ යොදන්න)

| | | |
|---|---|---|
| තනතුර : | රසායනාගාර සේවක | |
| | පුස්තකාල සේවක | |
| | පාසල් කාර්ය සහායක | |
| | පාසල් මුරකරු | |
| | පාසල් කම්කරු | |

01.සම්පූර්ණ නම :

..........................................................................................................................................

02.ස්ථාන මාරු ලේඛනයේ සඳහන් නම :

:..........................................................................................................

..........................................................................................................................................

02.1.හැඳුනුම්පත් අංකය : ..........................................................................................................

03. ස්ථිර ලිපිනය :

..........................................................................................................................................

04. තාවකාලික ලිපිනය :

..........................................................................................................................................

05.දුරකථන අංකය :

..........................................................................................................................................

06.වර්තමාන සේවා ස්ථානය :

..........................................................................................................................

07.වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය : අවු

:..........................................................................................

08.සේවා කාල සීමාව : අවු ............ මාස :............ දින:.................. සිට

.................................. දක්වා

09.

09.1 වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය : ......................................

..........................................................................................................................................

09.2. ස්ථාන මාරු ලේඛනයේ අනු අංකය : .................................. ස්ථාන මාරු අංකය:....................

09.3. ඔබ සමඟ ස්ථාන මාරු කරනු ලබන අනුප්‍රාප්තිකයා/අනුප්‍රාප්තිකයාගේ නම :..............................

..........................................................................................................................................

10. අභියාචනා මඟින් ඉල්ලුම් කරනු ලබන වෙනත් සේවා ස්ථාන :

...................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

11. අභියාචනා ඉදිරිපත් කිරීමට හේතු :

..........................................................................................................

..........................................................................................................................................

..................................................................................................................................................................

12. වෙනත් කරුණු :

..............................................................................................................................................

..................................................................................................................................................................

..................................................................................................................................................................

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

.................................. ........................

දිනය අත්සන

13. නිර්දේශ කරමි/නොකරමි

:.................................................................................................................................................................

...................................... ................................................................

දිනය විදුහල්පති,/ආයතන ප්‍රධානියා නිල මුද්‍රාව

14 .නිර්දේශ කරමි/නොකරමි

..................................................................................................................................................................

...................................... ................................................................

දිනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ නිල මුද්‍රාව